**වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය - 2021**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 මතය

**-------**

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

**-------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 19 වන පරිච්ඡේදයේ 5.3 වගන්තිය | උපලේඛනගත නිවාස ලබාගැනීමට හිමිකමක් ඇති නිලධාරීන් දෙදෙනෙකුගෙන් ඔවුන් පදිංචි වූ දින සිට නිල නිවාස කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පාලක මණ්ඩල අනුමැතිය මත අනෙකුත් විශ්වවිද්‍යාල අනුගමනය කරන පිලිවෙත් අනුව ලේඛකාධිකාරී හා උපකුලපති යන තනතුරු සඳහා නිල නිවාස වෙනුවෙන් කුලී නොගෙවා සිටීමට තීරණය කර ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | i. මුදල් රෙගුලාසි 571 | තැන්පත් කල දින සිට වර්ෂ 02 ක් ඉක්මවා තිබූ එකතුව රු. 648,703 ක් වූ රැඳවුම් මුදල් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේ දී ආදායමට ගැනීමට කටයුතු කරනු ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| | ii. මුදල් රෙගුලාසි 757 (2) | සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2020 හා 2021 වර්ෂවල වරින් වර පැවැති උග්‍ර කෝවිඩ් වසංගත තත්ත්වය මත භාණ්ඩ සමීක්ෂණ සිදුකර නොමැත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 13,654,128 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 4,638,179 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 9,015,949 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සේවක පිරිවැය රු.9,016,520 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

----------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුල පවත්වන ලද විභාගයන් අතරින් විභාග 53 කට අදාලව පාඨමාලාව සඳහා ලියාපදිංචි වූ සිසුන්ගෙන් විභාගය සඳහා පෙනී සිටි සිසුන්ගේ ප්‍රතිශතය සහ විභාගය සඳහා පෙනී සිටි සිසුන්ගෙන් විභාග සමත්වීමේ ප්‍රතිශතය සියයට 17 සිට සියයට 73 අතර විය. සිසුන් විභාග සඳහා සහභාගි නොවීමට හේතු සහ සමත් ප්‍රතිශතය අඩුවීමට හේතු සොයා බැලීමට කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි. | වැඩිහිටි සිසුන් අධ්‍යාපන කටයුතු කරගෙන යාමේදී, ඔවුන්ගේ පෞද්ගලික ගැටළු හේතුවෙන් පූර්ණ අවධානය අධ්‍යාපන කටයුතු කෙරෙහි යොමු කිරීම අපහසු වේ. එම හේතුවෙන්, පළමු අවස්ථාවේ විභාග සඳහා ඉදිරිපත් වීම සහ පලමු අවස්ථාවේ විභාග වලින් සමත් වීම සිදු නොවන අවස්ථා දැකිය හැක. | පාඨමාලා හදාරන සිසුන් විභාග සඳහා පෙනී සිටීමට අභිප්‍රේරණය කිරීමත් විභාග අසමත් වීමට හේතු සොයා බලා ඒවාට විසඳුම් සෙවීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රතීතනයන් ලබා ගැනීමට අදාළව 2010 මැයි 18 දින පවත්වනු ලැබූ රැස්වීමේදී විශ්වවිද්‍යාලය පවත්වාගෙන යනු ලබන ඉංජිනේරු හා උපාධි පාඨමාලා සඳහා ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයෙන් ප්‍රතීතනයන් ලබාගත යුතු බවට තීරණය කර තිබුණද උපාධි පාඨමාලාවල විෂයයන් අපේක්ෂිත මට්ටමට නොමැති වීම හේතුවෙන් තත්ත්ව සහතික ලබාගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නොහැකි වී තිබුණි. | මෙම විශ්වවිද්‍යාලය මගින් පිරිනමන ඉංජිනේරු උපාධි සඳහා ප්‍රතීතනය ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයෙන් ඉල්ලුම් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී | ප්‍රතීතනයන් ලබාගත හැකි ආකාරයට පාඨමාලාවල විෂයයන් සංශෝධනය කිරීමට කටයුතු කල යුතුය. |

### 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම දීර්ඝ කාලයක සිට භාවිතයට නොගත් අයිතම 13 කට අදාළ රු. 7,844,357 ක් වටිනා භාණ්ඩ 141 ක්ද, වටිනාකම හඳුනාගත නොහැකි අයිතම 17 කට අයත් භාණ්ඩ 102 ක්ද විගණිත දිනය වූ 2021 නොවැම්බර් 22 දින වන විටත් නිෂ්කාර්යව තිබුණි. | අපහරණය කිරීමට සැලසුම් කරඇති අතර කෝවිඩ් වසංගත තත්ත්වය මත සිදුකල නොහැකි විය. | උපයෝජනය කළ හැකි භාණ්ඩ උපයෝජනය කිරීමට හෝ අපහරණය කළයුතු භාණ්ඩ අපහරණ කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.3 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 927.34 කට විශ්වවිද්‍යාලය සඳහා වැඩහලක්, සිසුන් 600 ක් සඳහා නේවාසිකාගාරයක් සහ ආසන 300 කින් යුතු ආපනශාලාවක් ඉදිකිරීමට 2017 ජනවාරි 03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අනුමැතිය ලබාදී තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා එකතුව රු. මිලියන 281.36 ක් වෙන්කර තිබුණද ඉන් රු. මිලියන 22.5 ක් පමණක් උපදේශන ගාස්තු ලෙස ගෙවා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වාම අදාළ ව්‍යාපෘති ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙහි කටයුතු කඩිනම් කිරීම පිළිබඳව විශ්වවිද්‍යාලය විසින් අමාත්‍යාංශයේ අදාළ අංශ සමග නිරතුරු සාකච්ඡා කරන ලදී. එසේම මෙහි කටයුතු ප්‍රමාද වීම පිළිබඳව විවිධ හේතු ඉදිරිපත් කරන ලදී. එසේම අරමුදල් සපයා දිය හැකි බවත් මෙම විශ්වවිද්‍යාලය විසින් ලිඛිතව දන්වන ලද අතර මෙය කඩිනම් කරන ලෙස ඉල්ලා නැවත ලිපියක් මගින් දැනුම් දෙන ලදී. | ව්‍යාපෘති කටයුතු කඩිනමින් ආරම්භ කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

### 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 වර්ෂය සඳහා වූ විශ්වවිද්‍යාලයේ ප්‍රසම්පාදන සැලැස්මෙන් ප්‍රතිපාදනය කර තිබුණු රු. මිලියන 29.6 ක් වූ මිලදීගැනීම්ද රු. මිලියන 2.5 ක් වූ අළුත්වැඩියාවන් හා රු. මිලියන 0.3 ක් වූ සේවක පුහුණුකිරීම්ද සමාලෝචිත වර්ෂය තුළ ඉටුකර නොතිබුණි. | විශ්වවිද්‍යාලයේ ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් මිලියන 42.2 ක් වෙන්කර තිබූ අතර ප්‍රසම්පාදන කටයුතු සිදු කර අදාළ ඇනවුම් ලබාදුන් අතර පවතින වසංගත තත්වය, මත අමුද්‍රව්‍ය ලබා ගැනීමට ඇති අපහසුතා හා ණයවර ලිපි (LC) බැංකු මගින් ලබා ගැනීම කළ නොහැකි විය. | ප්‍රසම්පාදන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) සමාලෝචිත වර්ෂයේ පුස්තකාල පොත් මිලදී ගැනීම වෙනුවෙන් වෙන්කර තිබූ රු. මිලියන 02 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් උපයෝජනය කර නොතිබුණි. | 2021 ජුලි 19 දින ප්‍රාග්ධන භාණ්ඩ මිලදී ගැනීමේ ඉල්ලුම් පත්‍රය සමග ඉල්ලුම් කරන ලද්දේ e – book මිලදී ගැනීම සඳහාය. මෙම අවස්ථාව වන විට රටේ පැවති වසංගත තත්ත්වයේ බලපෑම නිසා හා රාජ්‍ය වියදම් අවම කිරීමේ ප්‍රතිපත්තිය නිසා e – book මිල දී නොගැනීමට තීරණය කරන ලදී. | ප්‍රසම්පාදන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය. |

**3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාලයේ පීඨ ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව රු. 14,506,548 ක මුදලකට 2016 සැප්තැම්බර් 10 වන දින පුද්ගලික කොන්ත්‍රාත්කරුවෙකුට ප්‍රදානය කර 2019 සැප්තැම්බර් 12 වන දින රු. 2,901,285 ක අත්තිකාරම් මුදලක් ලබාදී තිබුණි. කොන්ත්‍රාත්තුව 2019 නොවැම්බර් 22 වන විට නිම කල යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාල කාර්යය ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණු අතර රජයේ මුදල් වසර 2 කට වැඩි කාලයක් බාහිර පාර්ශවයක් වෙත අත රඳවා තිබුණි. තවද මෙම කොන්ත්‍රාත්තුව සඳහා ලබාගෙන තිබූ කාර්යසාධන සුරක්ෂණයේ වලංගු කාලය 2021 ජූනි 19 දින ඉකුත් වී ඇති අතර එය දීර්ඝ කර ගැනීමටද කටයුතු කර නොතිබුණි. | මෙම කොන්ත්‍රාත්තුව දින 60 ක කාලයක් තුල සිදු කිරීමට නියමිත වුවත් අදාල පීඨ ගොඩනැගිල්ලේ සිටින අධ්‍යයන කාර්යමණ්ඩලයට වෙනත් ස්ථාන ලබා දීමේදී පැන නැගුණු ගැටලු නිසා කොන්ත්‍රාත්කරුට සම්පූර්ණ වැඩබිම නියමිත දින වලට ලබා දීමට නොහැකි විය. එසේම පැවති කොවිඩ් වසංගත තත්ත්වය නිසා විශ්වවිද්‍යාලය මාස කීපයක්ම සම්පූර්ණයෙන්ම වසා දමා තිබුණි. | ලබාදී ඇති අත්තිකාරම් මුදල් රජයට අයකර ගැනීමට හා අළුත්වැඩියා කිරීම් කටයුතු කඩිනමින් ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව අනුමත කාර්යමණ්ඩලය තුල නොමැති තනතුරු 2 ක් සඳහා නිලධාරීන් තුන්දෙනෙකු බඳවාගෙන විගණිත දිනය වූ 2021 ඔක්තෝබර් 30 දක්වා රු. 11,612,706 ක මුදලක් දීමනා ලෙස ගෙවා තිබුණි. | මෙම විශ්වවිද්‍යාලයෙන් ප්‍රදානය කරනු ලබන තාක්ෂණික විෂය ධාරාවන්ට අදාල වන උපාධි පාඨමාලා සඳහා අධ්‍යයන සහ වෘත්තීය දැනුමෙන් සන්නද්ධ ආචාර්යවරුන්ගේ සේවය අත්‍යාවශ්‍ය වන අතර සේවා අවශ්‍යතාවය සලකා බලා පුරප්පාඩු කථිකාචාර්ය තනතුරු සඳහා ප්‍රවීණතා කුසලතා සහිත පුද්ගලයින් බඳවා ගන්නා තෙක් මෙම උපදේශකවරුන්ගේ සේවය ලබා ගැනීමට කටයුතු කර ඇත. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත සේවක බඳවා ගැනීම් සිදු කල යුතුය. |